# ජන හද සසල කළ අනුරපුර කලා නිර්මාණ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඩී. ජී. දේවින්ද ප්‍රභාත් ශ්‍රී ප්‍රේමරත්න*

තථාගත සම්බුද්ධ දේශනය සිවුවනක් පිරිස වෙත සම්ප්‍රේෂණය කිරීම, විවිධ නයින් ක්‍රියාත්මක කොට ඇත. ඒ අතරින් කලා නිර්මාණවලට ප්‍රමුඛත්වයක් හිමි වේ. ඊට හේතු වී ඇත්තේ මහජනයා විවිධ මානසික හා බුද්ධි මට්ටම් වලින් යුත්ත වන අතර යමක් අවබෝධ කරගැනීමේ විවිධත්වය යි. ඕනෑම පුද්ගලයෙකුට පහසුවෙන් ධර්මය සම්ප්‍රේෂණය කිරීමේ මාර්ගයක් ලෙස කලා කෘති භාවිතා කළ හැකිය. සෑම පුද්ගලයෙක්ම පාහේ කලාවට දක්වන රුචිකත්වය ඊට හේතුවයි.

ජනතාවගේ සිත් තුළ බුදුසමය තැන්පත් කිරීමෙහිලා ත්, එය ස්ථාවර කිරීමෙහිලා ත්, දේශකයන් වහන්සේ දේශනයෙනුත්, ලේඛකයා සාහිත්‍ය කෘතියෙනුත් කළ මෙහෙයට සමාන මෙහෙයක් කලාකරුවා සිය කලා කෞශල්‍යය මෙහෙයවා කරන ලද අයුරු අනුරාධපුර කලා කෘති විභාග කොට බැලීමේදී හෙළි පෙහෙලි වෙයි. එදා කලා කරුවන් කලා කෘති නිර්මාණයෙහි ලා පරමාර්ථය කොට ගත්තේ ඒ නයින් ජනතාවගේ හදවත් ආගමික හැඟුමින් සසල කරවා, ඔවුන් ආගම දහමට වඩ වඩාත් සමීප කරවීම බව පැහැදිලිවම පෙනී යයි. ප්‍රතිමාව, ස්තූපය, කැටයම, චිත්‍රය, ගෘහනිර්මාණය ආදී සෑම කලා කෘතියක්ම ආගමික අරුතක් ස්මතු වන සේ නිර්මාණය කළේ මේ පරමාර්ථය පෙරදැරි කොට ගත් නිසාම ය. මේ අනුව සලකන කල එදා කලාකරුවා මනා වූ සන්නිවේදන මාධ්‍යක් ලෙස කලා කෘතිය යොදා ගත් බව නිගමනය කළ හැකිය. අනුරාධපුර සමයේ එවැනි කලාංග පිළිබඳ අධ්‍යයනයක්, සාහිත්‍ය හා පුරාවිද්‍යා මූලාශ්‍ර පදනම් කරගෙන සිදුකිරීමට මෙහිලා බලාපොරොත්තු වේ.

ප්‍රමුඛ පද - සම්ප්‍රේෂණය, කලා නිර්මාණ, සාහිත්‍ය, ආගමික, අනුරාධපුර

* පාලි හා බෞද්ධ අධ්‍යනාංශය, කැලණිය විශ්ව විද්‍යාලය devindaprabhathsri@gmail.com